# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/41 – 2013 ජනවාරි 04 වැනි සිකුරාදා – 2013.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ සුළු කොට්ඨාසයේ තුම්බෝවිල ගමේ පිහිටි කොළඹ දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේඑස්බී/12/07 හා 2012.03.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 4.9954 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අක්ෂර 'ඒ' – කරදියාන කුඹුර හෙවත් කඩොලේ කුඹුර ඉඩම – ප්‍රමාණය: හෙක්. 4.9954 ක් පමණ**

උතුරට: හිමිකරු නොදන්නා කරදියාන කුඹුර හෙවත් කඩොලේ කුඹුර; නැගෙනහිරට: හිමිකරු නොදන්නා කරදියාන කුඹුර හෙවත් කඩොලේ කුඹුර සහ මහ ඇළ; දකුණට: මූලික පිඹුරු අංක කො.8949 හි අංක 1, 2 සහ මහ ඇළ; බටහිරට: මූලික පිඹුරු අංක කො.8949 හි අංක 1, 2 සහ හිමිකරු නොදන්නා කරදියාන කුඹුර හෙවත් කඩොලේ කුඹුර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/8/2011/පීසී/308.
2012 නොවැම්බර් මස 20 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 - 550

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මැද 3/1/2/71/21.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 03ජේ/95/එල්ආර්/499.

2001.09.25 වැනි දින 1203/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ සිංහල භාෂාවෙන් පළ වී ඇති ඉහත සඳහන් දැන්වීමේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය 03/005/95/එල්ආර්/499 වශයෙන් සඳහන්ව ඇති අංකය පහත පරිදි නිවැරදි විය යුතුයි.

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 03/ජේ/95/එල්ආර්/499.

ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2012 දෙසැම්බර් මස 24 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 551

1A – G 17107 – 375 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.